**සිරිමාවෝ බණ්ඩාරනායක විද්‍යාලය**
**බුද්ධ ධර්මය - I කොටස**
**10 ශ්‍රේණිය**
**I වාර පරීක්ෂණය - 2013**



- **සියලු ම ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.**

1. බුදුදහමෙහි මූලික ඉගැන්වීම් අතර සියල්ලෙහි පවත්නා වෙනස්වන ස්වභාවය පැහැදිලිව ම සඳහන් වන්නේ,
   (i) කර්ම විග්‍රහය තුළය (ii) නාම රූප විග්‍රහය තුළය
   (iii) ත්‍රිලක්ෂණය තුළය (iv) පටිච්චසමුප්පාදය තුළය

2. ත්‍රිශික්ෂාවෙහි සීලයට අයත් නොවන්නේ,
   (i) සම්මා ආජීවය (ii) සම්මා කම්මන්තය
   (iii) සම්මා වායාමය (iv) සම්මා වාචාය

3. අංග දොළහකින් සමන්විත පටිච්ච සමුප්පාදයට අනුව සළායතන ප්‍රත්‍ය කොට ගනිමින් ඇතිවන අංගය,
   (i) වේදනා නම් වේ (ii) නාමරූප නම් වේ
   (iii) උපාදාන නම් වේ (iv) ඵස්ස නම් වේ

4. අධාර්මික වෙළඳාම් පහෙන් වෙන්වීම ආර්ය මාර්ගයේ දක්වා ඇත්තේ,
   (i) සම්මා කම්මන්ත නමිනි (ii) සම්මා වායාම නමිනි
   (iii) සම්මා ආජීව නමිනි (iv) සම්මා සංකප්ප නමිනි

5. බුදුරජාණන් වහන්සේගේ ජීවිතයේ කැපී පෙනෙන ලක්ෂණයක් වන්නේ උන්වහන්සේ ප්‍රකාශ කළ දෑ ක්‍රියා කළ ආකාරය අනුව පරස්පර විරෝධ ගැටුමක් නොතිබීමයි. මෙකී ගුණාංගය වන්නේ,
   (i) යථාවාදී-තථාකාරී, යථාකාරී-තථාවාදී ගුණයයි
   (ii) තාදී ගුණයයි
   (iii) මහා කරුණා ගුණයයි
   (iv) නිහතමානී ගුණයයි යනුවෙනි.

6. බුදුරජාණන් වහන්සේගේ පද්මාකාර ජීවිතය තුළින් අපගේ ජීවිතයට ලබාගත හැකි ආදර්ශය වන්නේ,
   (i) සියලුම දෙනාට වඩා ඉහළින් සිටීමය
   (ii) මලක් සේ සිටීමය
   (iii) මලින් බුදුන් වැඳීමයි
   (iv) සමාජයේ ඇති අපවිත්‍ර දෑ වලින් නොගැවී පවිත්‍ර ජීවිතයක් ගත කිරීමය

7. ත්‍රිවිධ පුණ්‍ය ක්‍රියා යනු,
   (i) දාන,සීල,භාවනාවයි (ii) සීල,සමාධි,ප්‍රඥාවයි
   (iii) අනිත්‍ය,දුක්ඛ,අනාත්මයි (iv) මෙත්තා,කරුණා,මුදිතාවයි

8. කරණීය මෙත්ත සූත්‍රයේ මෛත්‍රී වඩන්නකු තුළ තිබිය යුතු ගුණාංග ගණන වන්නේ,
   (i) 8 කි (ii) 11 කි (iii) 12 කි (iv) 10 ක් යනුය.

9. සිව්පසයට අයත් නොවන්නේ,
   (i) චීවර (ii) පිණ්ඩපාත (iii) සේනාසන (iv) මී පැණි යනුය.

10. "අත්තූපනායික ධර්ම පර්යාය" නමින් හැඳින්වෙන්නේ,
(i) තමන් උපමා කොට අන් අයට වැරදි නොකිරීමයි
(ii) තමන් උසස් කොට අන් අය ගැන ක්‍රියා කිරීමයි
(iii) ධර්මය උපමා කොට අන් අය ගැන ක්‍රියා කිරීමයි
(iv) ලෝකය උපමා කොට අන් අය ගැන ක්‍රියා කිරීමයි.

11. බුදු දහමට අනුව අදාළ හේතු සාධක පවත්නා කල්හි ඵලයක් ඇතිවීම නම් වූ ඉගැන්වීම,
(i) ආර්ය අෂ්ටාංගික මාර්ගයයි (ii) චතුරාර්ය සත්‍යයයි
(iii) පටිච්ච සමුප්පාදයයි (iv) ත්‍රිලක්ෂණයයි

12. පස්වග තවුසන් රහත් භාවයට පත්වීම සඳහා ශ්‍රවණය කළේ,
(i) අනන්ත ලක්ඛණ සූත්‍රයයි (ii) දම්සක් පැවතුම් සූත්‍රයයි
(iii) ආදිත්ත පරියාය සූත්‍රයයි (iv) කරණීය මෙත්ත සූත්‍රයයි

13. සංසාරික ජීවිතයේ කවර අවස්ථාවක හෝ විපාක ලැබෙන කර්මය වන්නේ,
(i) උපපජ්ජවේදනීය කර්මයයි (ii) උපත්ථම්භක කර්මයයි
(iii) අපරාපරියවේදනීය කර්මයයි (iv) අහෝසි කර්මයයි

14. පටිච්ච සමුප්පාදයට අනුව සමාජ දුක ඇතිවන හේතුව නම්,
(i) ව්‍යාපාදය (ii) කායික දුශ්චරිතයයි
(iii) මානසික දුශ්චරිතයයි (iv) තණ්හාවයි

15. "චරථ භික්ඛවෙ චාරිකං බහුජන හිතාය බහුජන සුඛාය" යනුවෙන් බුදුරජාණන් වහන්සේ දේශනා කළේ,
(i) අගසව් දෙනමට ය (ii) ආනන්ද හිමියන්ට ය
(iii) ප්‍රථම රහත් හැට නමට ය (iv) භද්දවග්ගිය කුමාරවරුන්ට ය

16. විහාරස්ථානයක දී වන්දනා කළ යුතු අනුපිළිවෙල වන්නේ,
(i) චෛත්‍ය, බෝධිය, විහාරය (ii) බෝධිය,චෛත්‍ය,විහාරය
(iii) චෛත්‍ය,විහාරය,බෝධිය (iv) විහාරය, බෝධිය,චෛත්‍ය

17. තෙරුවන් කෙරෙහි කරුණු දැනීමෙන් ඇතිවන පැහැදීම,
(i) අචල භක්තියයි (ii) අමූලික ශ්‍රද්ධාවයි
(iii) අවෙච්චප්පසාදයයි (iv) අචල විශ්වාසයයි

18. බුද්ධත්වයට පත්වීමෙන් පසු බුදුරදුන් තම ගුරුවරයා ලෙස සැලකුවේ,
(i) ආලාර කාලාමය (ii) උද්දකරාම පුත්තය
(iii) සර්වමිත්‍රය (iv) තමන් අවබෝධ කරගත් ධර්මයි

19. දෙවන ධර්ම සංගායනාවට හේතු වූයේ,
(i) සුභද්‍ර භික්ෂුවගේ අධර්මවාදී ප්‍රකාශයයි
(ii) නිකාය 18 කට බෙදීමයි
(iii) වජ්ජිපුත්තක භික්ෂූන්ගේ දස වස්තුවයි
(iv) ධර්මාශෝක රජුගේ දස වස්තුවයි

20. ආර්ය මහා සංඝරත්නයේ ගුණ,
(i) 3 කි (ii) 6 කි (iii) 9 කි (iv) 8 කි

**සිරිමාවෝ බණ්ඩාරනායක විද්‍යාලය**

**බුද්ධ ධර්මය - II කොටස**

**10 ශ්‍රේණිය**

**I වාර පරීක්ෂණය - 2013**

- **පළමු ප්‍රශ්නය ඇතුළුව තවත් ප්‍රශ්න 4 කට පිළිතුරු සපයන්න.**

(01) I) සමථ භාවනාවට භාවිතා කරන වෙනත් නමක් ලියන්න.
II) ආර්ය අෂ්ඨාංගික මාර්ගයේ ප්‍රඥාවට අයත් අංග දෙක ලියා දක්වන්න.
III) අකුසල චේතනා නම් කරන්න.
IV) කුසල ක්‍රියා තුනක් ලියන්න.
V) ත්‍රිශික්ෂාව නම් කරන්න.
VI) ත්‍රිවිධ පුණ්‍ය ක්‍රියා ලියන්න.
VII) "චේතනාහං භික්ඛවේ" යන පාලි පාඨය සම්පූර්ණ කරන්න.
VIII) ත්‍රිවිධ චෛත්‍යය නම් කරන්න.
IX) ස්කන්ධ පහෙන් තුනක් නම් කරන්න.
X) අටලෝ දහමෙන් හතරක් ලියන්න.

(ලකුණු 10 x 2=20)

(02) I) ස්කන්ධ පහ පිළිවෙලින් නම් කරන්න.
II) "සංස්කාර" යන්නෙහි අර්ථය පැහැදිලි කරන්න.
III) ස්කන්ධ පහේ සැබෑ තතු පිළිබඳව කෙටි විමසුමක් කරන්න.

(03) I) කර්මය යනු කුමක්ද? යන ප්‍රශ්නයට විවරණය සපයන බුද්ධ ධර්මයේ සඳහන් සුප්‍රකට පාලි පාඨය කුමක්දැයි දක්වන්න.
II) එම විවරණයට අනුව කිසියම් ක්‍රියාවක් කර්මයක් වීමට බලපාන කරුණු කවරේද?
III) විපාක දෙන කාලය අනුව කර්මයේ ප්‍රභේද දක්වන්න.

(04) I) බුදුරදුන් දේශනා කරන ලද මැදුම් පිළිවෙත කුමක්ද?
II) එම මැදුම් පිළිවෙත ත්‍රිශික්ෂාවට බෙදා දක්වන්න.
III) මෛත්‍රී භාවනාව වඩන්නෙකු තුළ තිබිය යුතු ගුණාංග පිළිබඳව හැඳින්වීමක් කරන්න.

(05) I) සත් සතිය පිළිවෙලින් ලියා දක්වන්න.
II) නිවන් අවබෝධ කරගන්නෙකු විසින් අත්හල යුතු අන්ත දෙක නම් කරන්න.
III) ප්‍රථම රහතන් වහන්සේලා හැට නම නම් කර, බුදුරදුන් ඔවුන් අමතා කළ ප්‍රකාශය පැහැදිලි කරන්න.

(06) I) නීවරණ ධර්ම පිළිබඳව කෙටි හැඳින්වීමක් කරන්න.
II) "භාවනාව" ඔබට කෙතෙක් දුරට අදාළ වන්නේදැයි කෙටියෙන් පැහැදිලි කරන්න.
III) "ලෝක ස්වභාව ධර්මතා" යන්නෙන් බුදු දහමේ විස්තර කරන්නේ කුමක් දැයි පැහැදිලි කරන්න.

(07) I) "වපුරන ලද්දේ යම් බීජයක් ද එම බීජයට අනුරූපව ඵල ලැබෙනු ඇත" එම තේරුම ඇතුලත් වන ගාථාව ලියා දක්වන්න.
II) එම ගාථාවෙන් ඔබට ඇති වැදගත්කම පිළිබඳව ඔබේ අදහස් දක්වන්න.
III) බුදුදහම අනුව ඔබේ දිවිගමන සාර්ථක කරගන්නා අයුරු පැහැදිලි කරන්න.